**ශීර්ෂය 279- කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වාහනවල රජයේ තක්සේරුවට වඩා රු.109,348,000 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ මාර්ගෝපදේශ පරිදි ගිණුම්ගත කළ වත්කමක නැවත තක්සේරු අගය සිගාස් පරිගණක පද්ධතිය තුළ යාවත්කාලීන නොකළ යුතු වේ. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ii) | ගොඩනැගිලිවල රජයේ තක්සේරුවට වඩා රු.498,547,787ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වෙනසට හේතු පැහැදිලි කර ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දන්වා ඇත. | - එම - |
| (iii) | අන්තර්ජාල සම්බන්ධතා සඳහා මිල දී ගත් රු.28,944,592ක උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් සාරාංශය මඟින් ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙස දන්වා යවන ලදී. | - එම - |
| (iv) | නාගරික සංවර්ධන අධිකාරිය සතු රු.23,600,000ක් වටිනා ඉඩමක් ප්‍රාග්ධනිත කර තිබුණි. | මහනුවර කච්චේරියෙන් අදාළ විස්තර ලද පසු ඉදිරිපත් කළ හැකිය. | - එම - |

(ඇ) **විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ඉඩම් රු.17,700,000ක් ලෙස ගිණුම්ගත කර තිබුණද, අයිතිය පිළිබඳ සනාථ කිරීම් නොවුණි. | අයිතිය සනාථ කිරීමේ ලේඛන සොයාගැනීමට නොහැකි වී ඇත. | වත්කම්වල අයිතිය සනාථ කර ගත යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022/2023 මහ කන්නයේ වී මිල දී ගැනීම සඳහා ලද රු.8,222,000 ක ප්‍රතිපාදනවලින් රු.2,915,598ක් ඉතිරි වී තිබුණි. මේ සඳහා වෙනත් වියදම් දැරීමට හැකි නිසා ආහාරපාන හා සංග්‍රහ වියදම් වෙනුවෙන් රු.232,487ක් ද, ඉන්ධන, ලිපිද්‍රව්‍ය හා ගමන් වියදම් ලෙස රු.396,950ක් ද වැයකර තිබුණි. | ප්‍රවාහන වියදම් දැරීමට සිදු නොවීම නිසා මුදල් ඉතිරි වී ඇත. | ප්‍රතිපාදන ප්‍රසස්ත ලෙස භාවිතා කළ යුතු වීම. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | 1641 | - | රජය සතු වාහන 20 ක් පමණ දිස්ත්‍රික් ලේකම් නිල නිවාස පරිශ්‍රයේ ආවරණයකින් තොරව ගාල්කර තිබුණි. | ආවරණයක් සකස් කිරීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | අංක 1/2021 හා 2021 සැප්තැම්බර් 29 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | රු.30,004,458 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක වූ කොන්ත්‍රාත් 19 ක් ප්‍රාදේශීය ලේකම් විසින් නම් කළ දෙදෙනෙකුගේ කමිටුවක් මඟින් තෝරා නොගෙන සමිති වෙත පිරිනමා තිබුණි. | මෙම අඩුපාඩුව ඉදිරියේදී නිවැරදි කර ගන්නා ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් දුනිමි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වීම. |

**2.3** **තැන්පත් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 වෙත ලද රු.9,303,465ක් තැන්පතු ගිණුමට බැරකර වර්ෂ 5කට වඩා පැරණි වුවද, මේ දක්වාම අත්පත් කර ගැනීම් අවසාන කර නොතිබුණි. | අධිකරණයේ නඩු පැවතීම, අධිකරණයේ මුදල් තැන්පත් කිරීමට කටයුතු කිරීම, අත්පත්කරගැනීම් කටයුතු අවසන් නොවීම වැනි හේතු මත රඳවාගෙන ඇත. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වීම. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | "අරුණලු සහන" ණය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ ප්‍රජාමූල සංවිධාන 1274 ක් අතුරින් සංවිධාන 973 ක් ණය නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සමෘද්ධි සියලු රැස්වීම්වල දි මේ පිළිබඳ දැනුවත් කිරීම් සිදු කෙරේ. | ක්ෂුද්‍ර ණය අර්බුදයට නිසා මෙවැනි ණය ලබාදිය යුතුවීම. |
| (ආ) | සමෘද්ධි ඉසුර ණය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය තුළ ලබා දුන් ණයවලින් රු.2.895,224 ක් කල්පසු වී තිබුණු අතර පැවැති බොල් ණය වටිනාකම | කොරෝනා ව්‍යසනය හා රටේ පැවති ආර්ථික අර්බුදය මේ සඳහා බල පෑ තත්වයකි.ඒ අනුව ණය | ණය අයකර ගැනීමට හා බොල් ණය වැළැක්වීමට |

| | | | |
|---|---|---|---|
| | රු.15,154,541 ක් විය. මෙම ණය අයකර ගැනීමට පැහැදිලි වැඩපිළිවෙලක් නොතිබුණි. | පැහැරහැරීම් සිදුවීම හා ණය නිසි පරිදි අයකර ගැනීම් අපහසු විය. | පියවරගත යුතුවීම. |
| (ඇ) | දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු 45 ක් මඟින් ලබා දී තිබුණු ණයවලින් 2023 දෙසැම්බර් 31 දිනට රු.303,340,941ක බොල් ණය පැවැතිණි. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී සියයට 59කින් බොල්ණය වර්ධනය වී තිබුණ ද, එම ණය අය කිරීමට විධිමත් සැලසුමක් නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක වූ ආබාධිත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් 130 දෙනෙකු පිළිබඳව, විශ්‍රාම වැටුප් කාර්යභාරය පිළිබඳ ග්‍රාම නිලධාරි අත්පොතෙහි 6.4 ඡේදය පරිදි ග්‍රාම නිලධාරින් විසින් සිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මාස 03කට වරක් වාර්තා කර නොතිබුණි. | සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් මඟින් මෙම වාර්තාව ආකෘති පත්‍රයක් ආශ්‍රයෙන් ලබාගැනිමට කටයුතු කිරීමට සටහන් කරගෙන ඇත. | එම අත්පොතේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවීම. |
| (ඉ) | විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් අයකරකර ගැනීම සඳහා නව තොරතුරු පද්ධතියක් හඳුන්වා දී තිබුණ ද, දිස්ත්‍රික්කයේ විශ්‍රාම වැටුප් ලෙස වැඩිපුර ගෙවූ රු.8,892,859ක් 2023 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් අය කළ යුතුව පැවතුණි. | මාසික වාරික වශයෙන් වැඩිපුර ගෙවන ලද මුදල විශ්‍රාමිකයාගෙන් අයවීම සිදුවේ. | විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම වළක්වාලීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04කට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරියෙකු අනුයුක්ත කර නොතිබුණි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක 2023 වර්ෂයේදී අපයෝජනයට පත් ළමුන් සංඛ්‍යාව 119ක්, අවදානම් සහිත ළමුන් සංඛ්‍යාව 2155ක් හා පාසැල් නොයන දරුවන් සංඛ්‍යාව 63ක් වුවද, අවදානම් දරුවන් වෙනුවෙන් 2023 වර්ෂය තුළ පිළියෙල කරන ලද අවදානම් සැලැසුම් 55කින් සැලැසුම් 02කට පමණක් ප්‍රතිපාදන ලබා දී තිබුණි.එමෙන්ම, මේ සඳහා දත්ත පද්ධතියක් සකස් කර නොතිබුණි. | නිළධාරීන් අනුයුක්ත කිරීම් සම්බන්ධව ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය දැනුවත් කර ඇත. දත්ත පද්ධතියක් සකස් කරන ලෙස අදාළ නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇත. ආරක්ෂණ සැලසුම් 36 ක් වන අතර ප්‍රතිපාදන නොළද සැලසුම් සඳහා 2024 වසරේදී ප්‍රතිපාදන ලබාදීමට නියමිතය. | නිලධාරීන් සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම අනුයුක්ත කළ යුතු අතරම, දත්ත පද්ධතියක් සකස් කර අවදානම් සැලසුම් ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (උ) | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගේ 2020 ජූනි 11 දිනැති අංක 07/2020 දරන චක්‍රලේඛය පරිදි, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් ආබාධිත විශ්‍රාමිකයන් වෙනුවෙන් භාරකාර ගිවිසුමකට ඇතුළත් නොවී භාරකරුවන් හරහා ආබාධිතයින් වෙත රු.5,160,711 ක් ගෙවීම් කර තිබුණි. | අසම්පූර්ණ ගොනු හඳුනාගෙන එවා කඩිනමින් අවසන් කිරීමට සටහන් කරගෙන ඇත. | අදාළ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුවීම |
| (ඌ) | ජාතික සමගිය හා ප්‍රතිසංවිධානය සඳහා වන කාර්යාලයේ අවශ්‍යතා අනුව, සෑම ග්‍රාම නිලධාරි වසමකම සහජීවන සංගම් ස්ථාපනය කළ යුතු විය එහෙත්, දිස්ත්‍රික්කය තුළ එවැනි සංගම් 299ක් ස්ථාපිත කර නොතිබුණි. පිහිටුවන ලද සංගම් 274න් 125ක් ම ලියාපදිංචි කර නොතිබුණි. | වසම්වල ජනතාව එක්රැස් කරගැනීම අපහසු වීම නිසා සංගම් පිහිටුවීම ප්‍රමාද වී තිබේ. ලියාපදිංචි සහතිකය එවීමට යම් ප්‍රමාදයක් පවතී. | සෑම ග්‍රාම නිලධාරි වසමකම සහජීවන සංගම් ස්ථාපනය කළ යුතු වීම හා ලියාපදිංචි කළ යුතු වීම. |
| (එ) | වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම් ව්‍යාපෘතිය යටතේ දිළිඳු කාන්තාවන් සඳහා ණය ලබාදීම ප්‍රධාන අරමුණ වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක පමණක් රු1,020,000 ක ණය මුදලක් ලබා දී තිබුණි. | වැන්දඹු ණය වැඩසටහන සඳහා ප්‍රතිපාදන ලබාදී ඇත්තේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක් සඳහා පමණක් වේ. | දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි වැඩසටහන ක්‍රියාත්මක කළ යුතුවීම. |
| (ඒ) | විශ්‍රාමිකයින් මියයාමේ තොරතුරු කඩිනමින් වාර්තා කිරීමට ග්‍රාම නිලධාරීන් විසින් කටයුතු නොකිරීම නිසා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5ක මියගිය විශ්‍රාමිකයින් වෙනුවෙන් ගෙවූ රු.1,197,276 ක් අයකර ගැනීමට පැවතුණි. | ග්‍රාම නිළධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අනුව ග්‍රාම නිලධාරීන් දැනුවත් කළ යුතුවීම. |
| ( ඔ) | ගැබිණි මව්වරුන්ට 16 වැනි සතියේ සිට පෝෂණ දීමනාව ලබා දීම මෙම වැඩටහනේ අරමුණ වුවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09ක ගර්භනී මව්වරුන් 4193 දෙනෙකු එම දීමනාව ලබා ගැනීම ප්‍රමාද වීම සති 17ත් සති 34ත් දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | ප්‍රමාද වී අයදුම්පත ලබාදීම නිසා මෙම ගැටලුව ඇතිව තිබේ. | කඩිනමින් මෙම දීමනාව ලබා දිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | රුවන්වැල්ල ප්‍රදේශයේ නායයෑමෙන් අවතැන් වූවන් පදිංචි කිරීමට ඉඩම් අක්කර 9ක් හදිසි කටයුත්තක් සේ සලකා 2014, 2017 හා 2021 වර්ෂවල දී අත්පත් කරගෙන තිබුණ ද, ඉන් කොටස් කළ කැබලි 102කින් කැබලි 39ක් මේ දක්වා බෙදා දී නොතිබුණු අතර 2024 පෙබරවාරි වනවිටත් මෙම ඉඩම් වෙනුවෙන් හිමිකම් පරීක්ෂණ හෝ පවත්වා නොතිබුණි. | 2024 මැයි 20 දින හිමිකම් පරීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා ඇත. | අත්පත් කර ගැනීම් අවසන් කළ යුතුවීම. |
| (ක) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක සමෘද්ධි බැංකු විසින් ගෙවන ලද රු.156,315,710ක් මේ දක්වා ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව හා සමෘද්ධි අධිකාරිය වෙතින් තොරතුරු ලැබී නැත. | කඩිනමින් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ග) | බුලත්කොහුපිටිය ආහාර ඇසුරුම් කිරීමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.1,745,000 ක් වැයකර තිබුණද, එම ඉඩම නිරවුල් කරගෙන නොතිබුණි. | ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය වෙතින් එකඟතාව පළකිරීමේ ලිපියක් ලබාගෙන ඇත. | ඉදිකිරීම් කිරීමට පෙර අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ 2021 හා 2022 වර්ෂවල දී දිස්ත්‍රික්කය තුළ රු.64,159,400 ක් වැයකර ව්‍යාපෘති 28 ක් ක්‍රියාත්මක කර තිබුණද, අමුද්‍රව්‍ය මිල හා විදුලි බිල වැඩි වීම, ඉල්ලුම අඩුවීම, නවීන උපකරණ පහසුකම් නොමැතිවීම වැනි ගැටළු මත ප්‍රතිලාභීන්ගේ ආදායම් තත්ත්වය රු.30,000 සිට රු.10,000 ට අඩු මට්ටමක පැවැති බැවින් අපේක්ෂිත නිමවුම් මට්ටම කරා ළඟා වී නොතිබුණි. | එකඟ වෙමි. ආදායම් තත්ත්වය ඉහළ නැංවීම සඳහා නැවත සජීවී කරන ක්‍රමවේද භාවිතා කරමින් සිටී. | ක්‍රමවේද සකස් කර ආදායම තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කාන්තා චක්‍රීය ණය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය තුළ පිහිටවූ කාන්තා සමිති 621කින් සමිති 120ක් අක්‍රීය වී ඇති අතර, 2023 වර්ෂය තුළ සාමාජිකයින් 21468 දෙදෙනෙකුගෙන් 92 දෙදෙනෙකු වෙනුවෙන් පමණක් රු.1,020,000 ක ණය ලබා දී තිබුණි. කල්පසු වූ රු.604,317 ක හිඟ ණය ශේෂයක් ද පැවැතිණි. | සමිති ප්‍රමුඛතාගත කිරීමේ වැඩපිළිවෙළක් දියත් කිරීමට සූදානම කර ඇත. එමගින් අක්‍රීය වී ඇති සමිති යළි සක්‍රීය කිරීමට බලාපොරොත්තු වේ. | වැඩි සාමාජික පිරිසකට ණය දීම හා හිඟ ණය ශේෂ අයකළ යුතුවීම. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රුවන්වැල්ල ප්‍රදේශයේ 2016 වර්ෂයේ ස්වභාවික විපත් හේතුවෙන් නව නිවාස ඉදිකර ගැනීම සඳහා මුදල් ලබා දී තිබුණ ද, ඉදි කිරීම් අසම්පූර්ණ වීම මත නිවාස 13 ක් සඳහා තවදුරටත් ගෙවිය යුතු මුදල රු.4,485,000 ක් වූ අතර ඉන් නිවාස 05ක නිවාසලාභීන් පදිංචිව සිටී. | ප්‍රමාණවත් පරිදි ඉදිකිරීම් සිදුකර නොමැති බැවින් ඉතිරි වාරික මුදල් ගෙවීම සිදු කර නොමැත. | අර්ධ වශයෙන් ඉදිකරන ලද නිවාස ඉදිකිරීමට උනන්දු කරලීම හා පදිංචි කිරීමට කටයුතු සිදුකළ යුතුවීම. |
| (ආ) | මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ ශාරීරික සුවතාව ඇති කිරීම සඳහා රු.1,993,000 ක් වැයකර කායවර්ධක මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණ ද, ඒ සඳහා කිසිදු සැලැස්මක් නොතිබුණු අතර ගොඩනැගිල්ලේ ප්‍රමාණවත් කොටසක් ද අභාවිතව පැවතුණි. | ලිඛිත පුහුණු සැලැස්මක් හා වැඩපිළිවෙලක් සකස් කරන බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. | වත්කම් අභාවිතව නොතිබිය යුතු වීම. |
| (ඇ) | බුලත්කොහුපිටියේ අධි අවදානම් ප්‍රදේශවල පදිංචි වූවන්ට නිවාස ලබා දී තිබුණ ද, ඔවුන් එම අධි අවදානම් ප්‍රදේශවලම පදිංචි වී සිටීම නිසා රු.24,070,000 ක් වැයකර ඉදිකළ එවැනි නිවාස 26 ක් අභාවිතව පැවැතිණි. අධි අවදානම් නිවාස කඩා ඉවත් නොකිරීම ඊට හේතු වී තිබුණි. එමෙන්ම, අර්ධ වශයෙන් නිවාස ඉදි කිරීම නිසා අධි අවදානම් සහිත නිවසේම පදිංචි වී ඇති පවුල් ගණන 18 ක් විය. | මෙම සියලු සිදුවීම්වලට හේතුව ප්‍රතිලාභීන් හා රජය සමඟ බැඳීමක් නොමැති ආකාරයේ සින්නක්කර ඔප්පුවක් ඔවුන් සතුව තිබීම නිසා බව නිරීක්ෂණය වේ. | වත්කම් අභාවිතව නොතිබිය යුතු වීම හා අධි අවදානම් නිවාස ඉවත්කළ යුතුවීම. |

## 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංචාරක ආකර්ශනීය ආර්ථික බෝග නිෂ්පාදන පොකුරු ගම්මාන ව්‍යාපෘතිය සඳහා රු.1,519,301 ක ප්‍රතිපාදන කෑගල්ල ප්‍රදේශයට ලැබී තිබුණ ද, අවශ්‍ය වූ පැළ තවාන්වල නොමැතිවීම හේතුවෙන් එම ව්‍යාපෘතිය අක්‍රීය වී තිබුණි. | පැල නොතිබුණු බැවින් එම ප්‍රතිපාදන ගලිගමුව, දේශීය අල හා කාබනික පොහොර නිෂ්පාදන ගම්මානය සඳහා යොමු කරන ලදී. | ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස භාවිතා කළ යුතු වීම. |
| (ආ) | බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ආහාර ඇසුරුම්කරණය සඳහා යන්ත්‍රයක් මිල දී ගැනීම වෙනුවෙන් රු.2,562,500 ක ප්‍රතිපාදන ලැබී තිබුණ ද, අදාළ පිරිවිතරවලට ගැලපෙන ආහාර ඇසුරුම් යන්ත්‍රයක් නොලැබීම මත එම කාර්ය ඉටු වී නොතිබුණි. | ලංසු පිරිවිතර, අපේක්ෂිත පිරිවිතර හා නොගැලපීම මෙන්ම, ප්‍රතිපාදන සීමාව ඉක්මවා යාම යනාදී කරුණු ඊට හේතු වී තිබුණි. | - එම - |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉ-ජනගහන ලේඛන වැඩසටහන වෙනුවෙන් රු.262,000ක ප්‍රින්ටර් 2ක් මිල දී ගෙන තිබුණ ද, පරිගණක ලබා ගෙන නොතිබීමෙන් එම ව්‍යාපෘතිය 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | අඩුපාඩු පැවතියද තිබෙන සම්පත් උපයෝගී කරගෙන ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 හිම මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වේ. | - එම - |
| (ඈ) | කෑගල්ල පුරවර විශ්ව විද්‍යාලයේ ඉදිකිරීම් සඳහා රු.61,029,229 ක් වැයකර තිබුණි. පසුව එම ඉදිකිරීම් අසම්පූර්ණව පැවැතිය දී ම, සියලු ඉදි කිරීම් අත්හැර දමා තිබුණි. | පුරවර විශ්ව විද්‍යාල වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම අදාළ අමාත්‍යාංශය විසින් ගන්නා ලද තීරණයකි. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වීම. |
| (ඉ) | දෙහිඕවිට හත්තානගල දෙමළ පාසැලේ ඉදිකිරීමක් අත්හැර දමා ලද මුදලින් රු.14,202ක් වැයකර ඉතිරි රු.1,434,415 ක් ආපසු යවා තිබුණි. | කොන්ත්‍රාත්කරු ඉවත් වීම සහ පැවති අයහපත් කාලගුණ තත්ත්වය නිසා එය වෙනත් අයෙකුට පැවරීමට නොහැකි වීමෙන් ප්‍රතිපාදන ආපසු යවන ලදී. | ප්‍රතිපාදන ඌන උපයෝජිත නොවීමට කටයුතු කළ යුතු වීම. |

## 3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු243,993,402ක් වැයකර තිබුණි. එහෙත්, ඉදි කිරීම් ප්‍රගතිය සියයට 88ක් වීමෙන් අපේක්ෂිත අරමුණු මේ දක්වාම ඉටුකර ගැනීමට නොහැකිව පැවතුණි. | අපේක්ෂිත අරමුණු වැඩි ප්‍රමාණයක් මේ දක්වා ළඟා කර ගෙන ඇති අතර, ඉතිරි මහල් සඳහා ප්‍රතිපාදන ඉල්ලීමට කටයුතු කර ඇත. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වීම. |
| (ආ) | දිස්ත්‍රික්කය තුළ 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අධි අවදානම මත නැවත පදිංචි කළ යුතු පවුල් සංඛ්‍යාව 727 ක් වුවද, ඉන් විකල්ප පදිංචි වීමකට අකමැත්ත දක්වා ඇති පවුල් ගණන 97ක් වූ අතර, කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැති පවුල් ගණන 274 ක් විය. ඉතිරි පවුල් 356 න් ඉඩම් කට්ටි ලබා දී ඇති හා නිවාස ඉදිකිරීම සඳහා ඉඩමක් සතු පවුල් ගණන 186 ක් වූ අතර ඉතිරි පවුල් 170 ක් සඳහා 2024 මාර්තු මස තෙක්ම ඉඩම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලද රු.442,158,320 ක ප්‍රතිපාදනවලින් රු. 255,677,591 ක් පමණක් වැයකර තිබුණි. | මෙහි සඳහන් 170 යන අගයෙන් නිවසක් සහිත ඉඩමක් මිලදී ගත් ප්‍රතිලාභීන් ප්‍රමාණය වන 29 ක අගය අඩු විය යුතු අතර, ප්‍රතිලාභීන් 141 ක ප්‍රමාණය මෙම ව්‍යාපෘතිය තුළ විකල්ප අවස්ථා අතුරින් තමන් තෝරාගන්නා විකල්ප අවස්ථාව පිළිබඳව ස්ථිර තීරණයක් ලබා නොදීම මත කිසිදු අවස්ථාවක් සඳහා ඇතුළත් වී නොමැති අතර ඊළඟ වාරික මුදල් ලබා නොගැනීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | පදිංචි කිරීම් කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | නායයාම්වලින් අවතැන්වූවන් නැවත පදිංචි කළ ඉඩම් 22 ක් වෙනුවෙන් ජල ව්‍යාපෘති සඳහා රු.44,494,206 ක් ඇස්තමේන්තු සකස් කර තිබුණද, ඒවා ක්‍රියාත්මක වී නොතිබුණි. | කෑගල්ල ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක වේ. | අවතැන්වූවන් සඳහා යටිතල පහසුකම් සැපයීමට කටයුතු කළයුතු වීම. |

## 3.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දුම්වැටි හා මත්ද්‍රව්‍ය විරෝධී කොඩි වැඩසටහනින් ලද ආදායමෙන් ඉතිරි රු.7,479,433 ක් ප්‍රජා මූල සාමාජිකයන්ගේ සමාජ සුහසාධන කටයුතු සඳහා උපයෝජනය කළ යුතු වුවද, සැලසුමක් නොතිබීම නිසා එම මුදල් නිශ්කාර්යව පැවතිණි. | සැලැස්මක් සකස් කර ඊට අනුමැතිය ලබා ගෙන එම මුදලට අදාළව ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇත. | ලද මුදල් සංවර්ධනය සඳහා යෙදවිය යුතු වීම. |
| (ආ) ග්‍රාම ශක්ති ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය තුළ පිහිටුවා තිබුණු සමිති 130න් 2023 දෙසැම්බර් වන විට සමිති 119ක් ම අක්‍රීය ව පැවතිණි. ක්ෂුද්‍ර මූල්‍ය ගිණුමේ සහ සක්‍රීය හා අක්‍රීය සියලු සමිති ගිණුම්වල පැවති රු. 60,004,996ක ශේෂය නිෂ්කාර්යව පැවතීම මත වැඩසටහන අසාර්ථක වී ඇති බව නිරීක්ෂණය කෙරේ. | සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය විසින් නිකුත් කරන ලද උපදෙස් මාලාව අනුව ඉදිරි කටයුතු සිදු කරන මෙන් දැනුවත් කරන ලදි. | අක්‍රීය සමිති සක්‍රීය කර ගැනීමට හා අක්‍රීය ගිණුම් ශේෂ සක්‍රීය වන පරිදි වැඩසටහන් සකස් කිරීම. |

## 3.7 ප්‍රසම්පාදන

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.3 (ඊ) හා 2.8.4 (ඇ), 2.12, 5.4.1(අ), 6.3.1(ආ), 6.3.6, 4.3.1 හා 2.8.4 මාර්ගෝපදේශවල සඳහන්, පිළිවෙලින් තාක්ෂණික ඇගයීම් කමිටුවට බාහිර නිලධාරියෙකු පත්කර ගැනීම, රහස්‍යතා ප්‍රකාශ ලබා ගැනීම, ගිවිසුම්කරුවන්ගේ අයිතිවාසිකම්, කොන්ත්‍රාත් කෙටුම්පතේ සඳහන් කිරීම, ලංසු මුද්‍රා තැබිය යුතු බවට දැන්වීම, ලංසු විවෘත කිරීමේ වාර්තාවට අදාළ සාමාජිකයන් අත්සන් තැබීම, මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරිම, තාක්ෂණික ඇගයීම් කමිටුවට දිස්ත්‍රික් ඉංජිනේරු හා ඇස්තමේන්තුව සකස් කළ තාක්ෂණ නිලධාරීන් පත් නොකිරීම යනාදී කාරණා ප්‍රසම්පාදන කාර්යයන්හිදී බොහෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අනුගමනය කර නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලෙස සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කරන ලදී. | ප්‍රසම්පදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වීම. |

## 3.8 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (අ) මාර්ගෝපදේශයට පටහැනිව, ඉඩම් පවරා නොගෙන රු.3,262,974 ක ගොඩනැගිලි ඉදිකර තිබුණි. | මෙම ඉඩම් සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට යෝජිතය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවීම. |
| (ආ) | දිස්ත්‍රික්කය තුළ ග්‍රාම නිලධාරී කාර්යාල 107 ක් රජය සතු ඉඩම්වල පැවැතිය ද, එම ඉඩම්වල අයිතිය පවරාගෙන නොතිබුණි. | අයිතිය පවරා ගන්නා ලෙස සියලු ප්‍රාදේශිය ලේකම්වරුන්ට උපදෙස් දුනිමි. | ඉඩම්වල අයිතිය පවරාගත යුතුවීම. |
| (ඇ) | රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු වූ 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ රු.4,293,152 ක් වැයකර අඩක් නිම කළ ගොඩනැගිලි 06ක්, 2023 වර්ෂය වන විටත් අභාවිතව පැවැතිණි.. | ස්වදේශ කටයුතු අමාත්‍යාශයට දන්වා ඇතත් මේ දක්වා ප්‍රතිපාදන වෙන් කර නොමැත. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වීම. |

## 3.9 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බුලත්කොහුපිටිය ප්‍රදේශයේ 2018 වර්ෂයේදී රු.2,381,726ක් වැයකර ඉදිකළ මානංගලවත්ත ජල ව්‍යාපෘතිය මඟින් 2023 දෙසැම්බර් 31 දින දක්වාම ජලය බෙදා දීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව ජාතික ප්‍රජා ජල සැපයීම් දෙපාර්තමේන්තුවෙන් විමසීමක් කර ඇත. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වීම. |
| (ආ) | කෑගල්ල, දීවෙල වසමේ 2018 වර්ෂයේ ආරම්භ කළ ජල ව්‍යාපෘතියේ ඉදි කිරීම් අත්හැර දැමීම නිසා ඒ වෙනුවෙන් රු.1,733,622ක් වැයකර ඉදිකළ ජල ටැංකිය අභාවිතව පැවැතිණි. | තෙකලා විදුලිය නොලැබීම හා ප්‍රතිපාදන ඌනතාව නිසා ව්‍යාපෘතියේ කටයුතු නතර වී ඇත. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08ක අඩක් නිමකළ සේවා පියස් 12 ක් වර්ෂ 2කට වැඩි කාලයක සිට අභාවිතව පැවතීම නිසා ඒ වෙනුවෙන් වැය කළ රු.4,119,021 ක් අනාර්ථික වියදමක් වී තිබුණි. | ප්‍රතිපාදන සොයාගෙන වැඩ නිමකර භාවිතයට ගන්නා ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත. | - එම - |

## 3.10 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දැරණියගල ප්‍රාදේශීය ලේකම් නිල නිවස අවදානම් තත්ත්වයේ පැවැති ද, එහි අභ්‍යන්තර අලුත්වැඩියා සඳහා රු.1,942,177 ක් වැයකර තිබුණි. | නිල නිවස අළුත්වැඩියා කටයුතු සිදුකිරීම අත්‍යවශ්‍ය වූ බැවින් එසේ සිදුකරන ලදී. | රාජ්‍ය මුදල් ප්‍රසස්ත ලෙස වැය කළ යුතු වීම. |
| (ආ) | බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් ගොඩනැගිල්ල ඉදි කිරීමේදී ගල් කුඩු හා ගැවල් සඳහා රු.20,915,697 ක් ගෙවා තිබුණ ද, ඒ කිසිවක් මිනුම් ගෙන නොතිබුණි. | කපා ඉවත් කළ භූමියේ ප්‍රමාණය අනුව වැඩබිමට ගෙනා ගල්කුඩු සහ ගැවල් ප්‍රමාණ ගණනය කර ඇත. | ලොග් පොත් නඩත්තු කළ යුතුවීම. |
| (ඇ) | රුවන්වැල්ල සහකාර ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදුන් කුලී නිල නිවාසය සඳහා ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.3.1 උපවගන්තිය අනුව වැටුපෙන් සියයට 10ක් වූ රු.264,272 ක් අයකර නොතිබුණු අතර, එය ගිණුම්වල ද හෙළිදරව් කර නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන ඉදිරියේදී අයකිරීමට කටයුතු කළ හැකිය. | ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුවීම. |
| (ඈ) | 1979 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 03වන වගන්තිය අනුව වූ ලිඛිත පැවරීමකින් තොරව, 2017 මාර්තු මාසයේ ප්‍රාදේශීය ලේකම් සමඟ වූ එකඟතා ගිවිසුමකට අනුව ඉඩම් අක්කරයක් බදු අය කිරීමකින් ද තොරව පෞද්ගලික පාර්ශවයකට ලබා දී තිබුණි. | සංශෝධිත පනත ගැසට් කරන තෙක් ඉදිරි කටයුතු සිදු කළ නොහැකි වී ඇත. ඒ නිසා වාර්ෂික බදු මුදලක් හෝ අයකිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් දැනුවත් කර ඇත. | පනත ප්‍රකාර කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදි කිරීමේදී විධිමත් අනුමැතියකින් තොරව ගිවිසුම්ගත කොන්ත්‍රාත් මුදල ඉක්මවා රු.881,611 ක් | අවිනිශ්චිත මුදල ද ඇතුළත්ව ගෙවා ඇත්තේ උපරිම මුදලට වඩා අඩු මුදලකි. එමෙන්ම, | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් කර තිබුණි. එමෙන්ම, සියයට 10 ට වඩා වැඩි වූ රු.3,654,768 ක අතිරේක වැඩ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වී තිබුණි. | |
| (ඊ) | 2023 වර්ෂයේ මැයි මස සිට 2024 වර්ෂයේ අප්‍රේල් මස දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් රු.12,067,174ක් ගෙවා තිබුණි. එහෙත් ගිවිසුමට පටහැනිව, පැය 12 ක සේවා මුරයක් වෙනුවට පැය 24 ක සේවා මුරයක් පවත්වා තිබුණි. | ජීවන වියදම් ඉහළ යාම නිසා ආරක්ෂක සමාගමේ එකඟතාව මත ඇතැම් අවස්ථාවල දී පැය 24 ක සේවා මුරයක් ක්‍රියාත්මක කරවීමට සිදුවන බව සමාගම විසින් අප වෙත වාචිකව දන්වා ඇත. | ගිවිසුමට අනුව කටයුතු කළ යුතුවීම. |
| (උ) | ප්‍රාදේශීය ලේකම් 11 ක හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි පරිශ්‍ර පිරිසිදු කිරීම වෙනුවෙන් රු.5,506,135 ක් ගෙවීම් කර තිබුණි. එහෙත්, පස්වරු 5 .00 දක්වා කාර්යයන් ඉටු කිරීම, දිනකට තුන්වතාවක් පවිත්‍රතා කටයුතු සිදු කිරීම, කාර්යාල වෙන්කර ඇති ආවරණ සතියකට වරක් පවිත්‍ර කිරීම, ගෙබිම පිරිසිදු කිරීම හා මසකට දෙවතාවක් ආයතන ප්‍රධානින් සමඟ ප්‍රගතිය සමාලෝචනය ආදී ගිවිසුම් කොන්දේසි කිසිවක් ඉටුකර නොතිබුණි. | ආයතනය සමඟ ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කරනු ලබයි. | ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කරන බවට අධීක්ෂණය කළ යුතුවීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක නිලධාරීන් 117 දෙනෙකු 1997 වර්ෂයත් 2018 වර්ෂයත් අතර කාල පරාසයක් තුළ එකම සේවා ස්ථානයේ රැඳී සිටී. | මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර ස්ථාන මාරු ලබාදීමට වැඩපිළිවෙළක් සකස් කෙරේ. | අවශ්‍යතාවය පරිදි ස්ථාන මාරුවීම් සිදුකිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) | දිස්ත්‍රික්කය තුළ පරිපාලන ග්‍රාම නිලධාරි තනතුරු 04ක් හා වසම් 99ක ග්‍රාම නිලධාරි තනතුරු පුරප්පාඩුව පැවතුණි. | ග්‍රාම නිලධාරී පත්වීම් බලධරයා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වන අතර වැඩ බැලීමේ පත්වීම් ලබා දීම දිස්ත්‍රික් ලේකම් වෙත පැවරී ඇත. | පුරප්පාඩු පිරවීමට ඉදිරි කටයුතු සිදුකළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පුරප්පාඩු 149 ක් හා 11 දෙනෙකුගේ අතිරික්තයක් පැවති අතර, අනුමත නොවූ තනතුරුවලට සංවර්ධන නිලධාරින් 1286 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. | සංවර්ධන නිළධාරීන් බඳවාගෙන ඇත්තේ රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්වරයා විසිනි. | අදාළ තනතුරු අනුමත කරවා ගැනීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ඈ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11ක ග්‍රාම නිලධාරී වසම් 573කින් වසම් 213 ක් සඳහා පත්කළ ග්‍රාම නිලධාරීන් 2009, 2014, 2013 හා 2016 වර්ෂවල සිට එක් අයෙකු බැගින් ද, 2017 වර්ෂයේ සිට 05 දෙනෙකු ද, 2018 වර්ෂයේ සිට 45 දෙනෙකු ද, 2019 වර්ෂයේ සිට 74 දෙනෙකුද, 2020 වර්ෂයේ සිට 21 දෙනෙකු ද, 2021 වර්ෂයේ සිට 70 දෙනෙකු ද වශයෙන් ස්ථාන මාරුවීම් නියෝගවලට යටත් නොවී එකම වසමේ සේවය කරමින් සිටී. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තුළ වසම් අතර ස්ථාන මාරුකිරීමේ බලය අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇති අතර මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලෙද ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කරන ලදී. | අවශ්‍යතාවය පරිදි ස්ථාන මාරුවීම් සිදුකිරීමට කටයුතු කළ යුතුවීම. |